# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2366/20 – 2024 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා – 2024.01.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී. 277/40.

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

33 වන වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ වන මා විසින්, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමතය සහිතව, මේ නිවේදනය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥාපනතේ කාර්යය සඳහා “ පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ භූමියක්” ලෙස සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ,**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2023 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.


1A – G 41222 – 07 (2024/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ දෙමටමල්ගම ඌත්තුවෙල්ලිය භූමි ප්‍රදේශය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු විලච්චිය කෝරළේ අංක 367 දෙමටමල්ගම ග්‍රාම නිලධාරී වසමේ දෙමටමල්ගම, බෝගොඩ යන ගම පිහිටි දෙමටමල්ගම, ඌත්තුවෙල්ලිය ඉඩමට සර්වේයර් ජනරාල් විසින් AA/DSO/2020/364 දරන සහ 2020.07.30 වන දින මැන සාදන ලද පිඹුර ප්‍රකාරව වෙන් කළ කැබලි අංක A දරන කොටස උතුරට, නැගෙනහිරට, දකුණට හා බටහිරට මායිම් වන අංක 02 දරන මූලික පිඹුරේ 3232 දරන දෙමටමල්ගම රක්ෂිතයෙන් වට වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් දහසයයි දශම හයයි හතයි නවයයි පහකින් (හෙක්ටයාර් 16.6795) සමන්විත වූ ඉඩම වේ.

EOG 01 - 0087